# <u>වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව</u>

## <u>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව</u>

### <u>2021 වර්ෂයේ / 44 වන සභා වාරයේ විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව</u>

### <u>2021.11.01</u>

<u>පැමිණීම</u>

1. ගරු සභාපති කේසුසන්ත .වි. පෙරේරා මහතා
2. ගරු උප සභාපති ආර්නිලංක සඳකැල් මහතා .ඒ.
3. ගරු මන්ත්‍රී ඒම මහතාකිත්සිරි අභයවික්‍ර .එම්.එස්.
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාජෝන් බැප්ටිස් ප්‍ර .
6. ගරු මන්ත්‍රී යුජුඩ් එම්මානුවෙල් මහතා .
7. ගරු මන්ත්‍රිනි  ආර්නිරෝෂා ජීවන් .ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී එම් විශ්වනාත් මංචනායක මහතාජිනේන්ද්‍ර .එම්.
9. ගරු මන්ත්‍රී එල්යංකර මහතාජගත් ප්‍රි. කේ.
10. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාලෙනාඩ් දීමස් ප්‍ර .
11. ගරු මන්ත්‍රී ඒරෙක් .ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී කේචමින්ද කුමාර කරුණානායක මහතා .එල්.
13. ගරු මන්ත්‍රිනි ජී යන්ගිකා පෙරේරාලීනා ප්‍රි .මහත්මිය
14. ගරු මන්ත්‍රිනි ජේදීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය .කේ.
15. ගරු මන්ත්‍රී කේනොඑල් සුදත් ජානක පෙරේරා මහතා .
16. ගරු මන්ත්‍රිනි අයි .එච් .නයෝමි රම්‍යලතා මහත්මිය
17. ගරු මන්ත්‍රී එල්දිනේෂ් චන්දන පෙරේරා මහතා .
18. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාඩ ෂවින් ප්‍රරෙන්ප්‍රි .ඒ.
19. ගරු මන්ත්‍රී ආර්අකිල ශිරංග රාජපක්ෂ මහතා .පි.
20. ගරු මන්ත්‍රී ඩීඅමල් සුරංග ම .එල්.හතා
21. ගරු මන්ත්‍රී ඩබ්ස්ටැන්ලි තිසේරා ම .හතා
22. ගරු මන්ත්‍රී ජිනාන්දු මහතාඅශේන් විමුක්ති ප්‍ර .කේ.
23. ගරු මන්ත්‍රී එච් .ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී ඩබ්නාන්දු මහතාශිරෝන් ගාමිණී අසෝක ප්‍ර .
25. ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා
26. ගරු මන්ත්‍රී එල්නාන්දු මහතානාත් ප්‍රසුසන්ත ශ්‍රී.
27. ගරු මන්ත්‍රී එම්යන්ත පෙරේරා මහතායාල් බ්‍රි .
28. ගරු මන්ත්‍රී බි .ඒ.එස්. ශාන්ත පෙරේරා මහතා

29. ගරු මන්ත්‍රී ඩබ්නාන්දුනාත් ප්‍රසුරේන් ඇන්ටන් ශ්‍රී . මහතා
30. ගරු මන්ත්‍රිනි එම්මේරි චාලට් කුරේරා මහත්මිය .
31. ගරු මන්ත්‍රිනි ආර්නදීකා රණවිර මහත්මිය .පි.
32. ගරු මන්ත්‍රී ඩබ්මසිංහ මහතාගෝඨාභය වික්‍ර .ඒ.
33. ගරු මන්ත්‍රී අයි.බී. සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
34. ගරු මන්ත්‍රී එස්දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා .එම්.

මෙදින පෙ.ව.10.00ට පමණ න්‍යායපත්‍රානුකූලව 2022 අයවැය කෙටුම්පත සම්මත කිරීමට අදාල විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව විශේෂ මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා ඇතුළු නිලධාරීන් සියළු දෙනාවම විශේෂ මහා සභා රැස්වීම සඳහා පිළිගනිමින් අද දින ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවා ඇති රීති අනුව 2022 අයවැය කෙටුම්පත සම්මත කිරීම සිදු කරනු ලබන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමාගේ 2022 අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා වෙත සහ ප්‍රතිපක්ෂ නායක ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා වෙත පිළිගැන්වීමෙන් අනතුරුව සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රීවරියන් වෙත පිටපත් බෙදා දෙන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් 2022 අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපතිතුමාගේ
2022 අයවැය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය.

ගරු උපසභාපතිතුමනි, ගරු විපක්ෂනායක තුමනි, ගරු කමිටු සභාපතිවරුනි, ආණ්ඩු පක්ෂ, ප්‍රතිපක්ෂ නියෝජනය කරන සියළුම ගරු මන්ත්‍රීතුමනි / තුමියනි,
අභියෝගාත්මක 2021 වර්ෂය තුලදී ද වයඹ අභිමානය තවදුරටත් රැක ගනිමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මාගේ දෙවැනි ධූර කාලය තුල හතරවෙනි වරටත් 2022 වර්ෂයට අදාල අයවැය කෙටුම්පත ඉදිරිපත් කරන්නට ලැබීම මා ලද භාග්‍යයක් බව සතුටින් දන්වමි.
2020 වර්ෂය මෙන්ම 2021 වර්ෂය ද ශ්‍රී ලංකා රජයට මෙන්ම සියළුම පළාත් පාලන ආයතන වලටද ඉතාමත් අභියෝගාත්මක වර්ෂයක් විය. ඒ අනුව එම අභියෝගය හමුවේ පසුබට නොවී හැකි උපරිමයෙන් අප ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට හැකිවූ බව මාගේ විශ්වාසයයි.
පොදු මහජනතාව අපහසුතාවයට පත් කොරෝනා වසංගත තත්වයෙන් අප බල ප්‍රදේශයේ ජනතාව ආරක්ෂා කර ගැනීම සඳහා රජය විසින් ගෙනගිය සමස්ථ වැඩපිළිවෙල මෙහිදී පැසසිය යුතුය. විශේෂයෙන් එන්නත්කරණය ද, රෝගී වූ පවුල් ඒකක සඳහා සහනාධාර සලසාදීමද, විශේෂකොට සැලකිය යුතුය. ඒ අනුව වෙන්නප්පුව බල ප්‍රදේශයේ වෙන්නප්පුව හා දංකොටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල මූලිකත්වයෙන් සිදු කරනු ලැබූ එන්නත්කරණ වැඩපිළිවෙලේදී තම මන්ත්‍රී කොට්ඨාසය ආවරණය කරගනිමින් එන්නත්කරණ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මන්ත්‍රී කොට්ඨාසය භාර මාගේ මන්ත්‍රීතුමන්/තුමියන් දුන් සහය මා ඉතා අගය කොට සළකමි. එලෙසම එම කටයුතු අප කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කිරීමේ දි ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයද, ලබා දුන් සහයෝගය පිළිබඳව ද, මා කෘතඥ පූර්වකව සිහිකරමි.
මෙහිදී විශේෂයෙන් අදාළ සෞඛ්‍ය අංශ වෙත අප සතු වාහන ද, ලබා දෙමින් අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයමින් කොරෝනා වසංගතය වෙනුවෙන් කැපවන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා ද, අපට හැකි අයුරින් සංග්‍රහ කටයුතු සිදු කිරීම ද ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය අත්පත්‍රිකා

මුද්‍රණය කර දීමටද, දැනුවත් කිරීම් කටයුතු සිදු කිරීමටද, කටයුතු කල බව තවදුරටත් සඳහන් කරමි.
මෙවැනි වසංගත රෝගයක් හේතුවෙන් ව්‍යසනකාරී වාතාවරණයක් ගෙවා දමමින් ඉදිරි වර්ෂ නැවුම් බලාපොරොත්තු සමඟ ඉදිරියට යා හැකි වෙතැයි යන පරම අධිෂ්ඨානය මුල් කරගෙන 2022 අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට මා උත්සහ කල බැව් සතුටින් දන්වමි.
ඒ අනුව 2022 වර්ෂය තුලදී රුපියල් තිස්නව කෝටි හතලිස් එක් ලක්ෂ අසූපන් දහස් දෙසිය අසූවක (394,185,280.00) ආදායමක් උපයාගත හැකි බවට ඇස්තමේන්තු කර ඇත. එම ආදායම් ඇස්තමේන්තුව 2021 වර්ෂයට වඩා හාරකෝටි දාහතර ලක්ෂ තිස් හතර දහස් අසූවක (41,434,080.00 ) වැඩි වීමක් පෙන්නුම් කරයි.
මෙහිදී වරිපනම් හා බදු යටතට ගැනෙන වරිපනම් බදු / අක්කර බදු / ව්‍යාපාර බදු / කර්මාන්ත බදු / විනෝද බදු / ඉඩම් කට්ටි කිරීම් 1% බදු ආදායම් මඟින් රුපියල් එක් කෝටි අනූහය ලක්ෂ නව දහස් හයසිය හැත්තෑපහක (19,609,675.00) ආදායමක්ද,
කුලී ආදායම වශයෙන් ( කඩකුලී / බදු කුලී /වෙනත්) රුපියල් තුන්කෝටි හැටහය ලක්ෂ හතලිස් දෙදහස් හයසිය පහක (36,642,605.00 ) ආදායමක්ද උපයාගැනීමට අප සභාව බලාපොරොත්තු වෙමි.
මෙහිදී 2021 වර්ෂයේ ඇස්තමේන්තුගත බදුකුලී ආදායම් වල අයවීමේ අඩු වීමක් පෙන්නුම් කරන බැවින්, එම තත්වය පදනම් කරගෙන 2021 වර්ෂයට වඩා 2022 වර්ෂය සඳහා රුපියල් විසිඅට ලක්ෂ පනස් නව දහස් තුන්සිය අනූපහක (2,859,395.00 ) අඩුවීමක් පෙන්නුම් කර ඇත. සතිපොලවල් සම්බන්ධයෙන් පවතින ගැටළු තත්වයන් හේතු කරගෙන මෙම තීරණය ගත් බවත් තත්වය යහපත් වුවහොත් මෙම ඇස්තමේන්තුව අභිබවා ආදායමක් උපයාගත හැකි වනු ඇතැයි ද මා තුල විශ්වාසයක් ඇත.
බලපත්‍ර ගාස්තු මඟින් රුපියල් හතලිස් දෙලක්ෂ අනූ දහසක් (4,290,000.00) බලාපොරොත්තු වන අතර මෙහිදී වෙළඳ බලපත්‍ර මඟින් රුපියල්ලක්ෂ දාහතරක් (1,400,000.00) උපයා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.
පරිසර බලපත්‍ර වෙනුවෙන් රුපියල් ලක්ෂ අටක් ද (800,000.00) විශේෂ බලපත්‍ර (සංචාරක හෝටල් වලින්) රුපියල් දස ලක්ෂ පනස් දහසක් ද (1,050,000.00) උපයා ගැනිමට ඇස්තමේන්තු කර ඇත.
සේවා ගාස්තු සඳහා රුපියල් එක්කෝටි දහඅට ලක්ෂ විසිදහසක් (11,820,000.00) උපයාගැනීමට හැකිවෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, වරෙන්තු ගාස්තු වශයෙන් රුපියල් පන්කෝටි අනූලක්ෂ අනූතුන් දහසක්ද (59,093,000.00) ඇස්තමේන්තු කර ඇත. මෙහිදී උසාවි දඩ වශයෙන් රුපියල් පන්කෝටි අසූ ලක්ෂයක (58,000,000.00) ආදායමක් ලබාගත හැකි වෙතැයි මා අපේක්ෂා කරමි. එය 2021 වර්ෂයට වඩා රුපියල් ලක්ෂ තිහක (3,000,000.00) වැඩිවීමකි.
වෙනත් ආදායම් වශයෙන් රුපියල් දාහතර කෝටි හැටහත් ලක්ෂ තිස් දහසක (146,730,000.00)ආදායමක් ලැබෙනු ඇතැයි පුරෝකථනය කළ අතර රුපියල් කෝටි දහතුනක මුදලක් (130,000,000.00) මුද්දර ගාස්තු වශයෙන්ද සේවක ණය පොලී වශයෙන් රුපියල් ලක්ෂ දොළහක්ද (1,200,000.00) විකුණුම් වශයෙන් රුපියල් එක්කෝටි පන් ලක්ෂ තිස් දහසක්ද (10,530,000.00)ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ෂයේදී විශේෂයෙන්ම ඉදිවන නව කොම්පෝස්ට් අංගනයෙන් ප්‍රතිලාභ ලබන වර්ෂයේදී ලබාගත හැකිවනු ඇතැයි යන දැඩි විශ්වාසයක් මා තුළ පවතින බැවින් කොම්පොස්ට් විකුණුම් ආදායම රුපියල් ලක්ෂ 100 දක්වා වැඩි කිරීමට මා විසින් උපදෙස් දෙන ලදි.
ආදායම් ආධාර වශයෙන් වැටුප් ප්‍රතිපූර්ණ සඳහා රුපියල් එකලොස් කෝටි හැටලක්ෂයක මුදලක් (116,000,000.00 ) ලැබීමට නියමිතව ඇත.
මේ ආකාරයට විවිධ ආදායම් ශීර්ෂ යටතේ ආදායම් උපදවා ගැනීමට බලාපොරොත්තු වන අතර නව ආදායම් මාර්ග සොයා ගැනීම සඳහා ප්‍රවේශ වීම්ද සිදුකල යුතුව ඇත. ඒ අනුව වරිපනම් නව තක්සේරුව සඳහා ඒකක හඳුනාගෙන ලේඛනගත කිරීමට බඳවා ගත් නව සේවකයින් දස දෙනා යොදවා ඉදිරි වර්ෂයේදී එම කටයුත්ත සිදු කර තක්සේරු දෙපාර්තමේන්තුවට භාර දීමට මා බලාපොරොත්තු වෙමි.
මීට අමතරව අප බල ප්‍රදේශයට (උල්හිටියාවට) වෙනත් ප්‍රදේශ වලින් විශාල වශයෙන් මසුන් තොග වෙළදාම සඳහා මාළු ලොරි රථ පැමිණෙන බවත් මේ පිළිබඳව සම්බන්ධීකරණයක් සිදු කර එලෙස පැමිණෙන මාළු රථ වලින් මාළු 1Kg සඳහා ශත 50ක මුදලක් අයකරගැනීම තුලින් ඒ මඟින් විශාල ආදායමක් උපයා ගැනීමටත් හැකිවනු ඇතැයි මා අපේක්ෂා කරන බැවින් ඒ සඳහා අවශ්‍යය කටයුතු සිදු කිරීමටත් බලාපොරොත්තු වෙමි.

උපයා ගන්නා ආදායම් වලට අමතරව 2021 මෙම වර්ෂයේ දී මෙන් 2022වර්ෂයේ දී පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය හා මහා මාර්ග අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ හරහා ප්‍රාග්ධන ආධාර ලබා ගැනීමටද කටයුතු කරන බව පෙන්වා දෙමි.
මෙම වර්ෂය තුලදී විවිධ වැඩ විෂයන් සඳහා රුපියල් විසිතුන් කෝටි තිස්පන් ලක්ෂ අනූහය දහස් නවසිය විසිහයයි ශත හැට හතක (233,596,926.67)ආධාර මුදල් ලබා ගැනීමට අප සභාව සමත් වී ඇත.
ඒ අනුව සෙන්දිරියමුල්ල නව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමට රුපියල් දෙකෝටි තිස් එක් ලක්ෂ නව දහස් එකසිය අසූඑකයි ශත අසූඅටක්ද (23,109,181.88) කොම්පෝස්ට් අංගනයේ විවේක කාමරය ඉදි කිරීමට රුපියල් තිස්නව ලක්ෂ විසිදහස් හාරසිය හැත්තෑ නවයයි ශත දහනවයක්ද (3,920,479.19) පළාත් සභා සහ පළාත් පාලන රාජ්‍ය කටයුතු අමාත්‍යාංශය මඟින් ලැබීමට නියමිත වීම අප ලද ජයග්‍රහනයකි.
තවද මහා මාර්ග අමාත්‍යාංශය මඟින් සෞභාග්‍යයේ මංපෙත් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා ආධාර වශයෙන් රුපියල් දහනව කෝටි පනස් ලක්ෂයක (195,000,000.00) ප්‍රතිපාදන ලැබීමට නියමිතව ඇත.
තවද පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් සිරිගම්පල සතිපොල නවීකරණය සඳහා රුපියල් ලක්ෂ දහයක්ද, (1,000,000.00)කොළින්ජාඩිය රොමයිනෝ ගාර්ඩින් ප්‍රජා ශාලාවේ උඩු මහල ඉදිකිරීම සඳහා රුපියල් විසිහතර ලක්ෂ පනස් නව දහස් හත්සිය අසූ නවයයි ශත හයක්ද,(2,459,789.06)
ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධනය රාජ්‍ය අමාත්‍යාංශය මඟින්,

- වයික්කාල එකමුතු ක්‍රීඩා සමාජ ක්‍රිඩාංගනය ඉදිකිරීමට රුපියල් දාහතර ලක්ෂ හැටහත් දහස් හාරසිය හැත්තෑ හයයි ශත පනස් හතරක්ද (1,467,476.54)
- මැද කිරිමැටියාන වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනයට රුපියල් දාසය ලක්ෂ හතලිස් දහසක්ද (1,640,000.00)
- ලුණුවිල ප්‍රදීපා ක්‍රීඩාංගනය ඉදිකිරීමට රුපියල් ලක්ෂ පනහක්ද (5,000,000.00) වශයෙන් ප්‍රතිපාදන ලැබීමට නියමිත බැවින් මේ වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

2022 වර්ෂයට අදාලව සකස්කරන ලද අයවැය කෙටුම්පත අනුව උපයා ගැනිමට අපේක්ෂිත රුපියල් තිස්නමකෝටි හතලිස් එක්ලක්ෂ අසූ පන්දහස් දෙසිය අසූවක (394,185,280.00) ආදායම් ඇස්තමේන්තු සලකා බලා සභාවේ පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු ඒ අනුව සකස් කර ඇත.
2022 වර්ෂට අපේක්ෂිත මුළු පුනරාවර්ථන වියදම් ඇස්තමේන්තුව රුපියල් තිස්නව කෝටි හතලිස් එක් ලක්ෂ පනස්පන් දහස් පන්සියයකි. (394,155,500.00)එයින්,

- මුළු පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුව රුපියල් තිස්දෙකෝටි හතලිස්හතර ලක්ෂ හැටපන් දහස් පන්සියයකි. (324,465,500.00)
- ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව රුපියල් හයකෝටි හැටහය ලක්ෂ පනස් දහසකි.(66,650,000.00)
- ණය ගෙවීම් රුපියල් තිස්ලක්ෂ හතලිස් දහසකි.(3,040,000.00)

වැටුප් හා වේතන වෙනුවෙන් රුපියල් දාසය කෝටි එක්ලක්ෂ විසිඑක්දහසක් ද (160,121,000.00) සංයුක්ත හා වෙනත් දීමනා වෙනුවෙන් රුපියල් පහළොස් ලක්ෂ හතලිස්පන් දහසක්ද (1,545,000.00) වැය වෙතැයි ඇස්තමේන්තු කර ඇත.
සැපයුම් හා උපකරණ වෙනුවෙන් රුපියල් තුන්කෝටි අසූතුන් ලක්ෂ අනූපන් දහසක් (38,395,000.00) ප්‍රතිපාදන වශයෙන් වෙන් කර ඇත. ඒ අතරට,

- ලිපි ද්‍රව්‍ය හා පරිභෝජ්‍යය සඳහා රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑපන් දහසක්ද (3,575,000.00)
- ඉන්ධන සඳහා රුපියල් එක්කෝටි හැත්තෑහතර ලක්ෂ හැටපන් දහසක් (17,465,000.00)
- වීදි පහන් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ පනහක්ද (5,000,000.00)
- ආයුර්වේද බෙහෙත් සඳහා රුපියල් ලක්ෂ විස්සක් ද (2,000,000.00) වශයෙන් ප්‍රතිපාදන ද ඇතුලත්ව ඇත.

ඊට අමතරව ආදාහනාගාර සඳහා ගෑස් මිලදී ගැනීම කසල කළමණාකරණය හා සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා සඳහා ද්‍රව්‍ය මිලදී ගැනීම් ආදිය ද අනෙකුත් සැපයුම් ද්‍රව්‍ය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මෙයට ඇතුලත් වේ.

නඩත්තු හා අළුත්වැඩියා යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඒ සඳහා රුපියල් පන්කෝටි හැත්තෑඑක් ලක්ෂ අනූ දහසක මුදල්(57,190,000.00) ප්‍රතිපාදන වෙන් කර ඇත.
මෙහිදී මංමාවත් පදික වේදිකා පාලම් කාණු නඩත්තුව සඳහා රුපියල් තුන්කෝටි විසිපන් ලක්ෂයක් (32,500,000.00) වෙන්කර ඇති අතර එයින් මාර්ග අංශයේ සියළුම නඩත්තු කටයුතු සඳහා යොදවා ඇති සේවකයින් සඳහා පඩි ගෙවීමට රුපියල් එක්කෝටි හැත්තෑපන් ලක්ෂයක් (17,500,000.00) වැය වෙතැයි ගණන් බලා ඇත. ඉතිරි රුපියල් එක්කෝටි පනස් ලක්ෂය මඟින් කොට්ඨාශයකට රුපියල් ලක්ෂ හය බැගින් මාර්ග අළුත්වැඩියා කටයුතු කිරීමට වෙන් කර ඇත. මෙහිදී අදාල රුපියල් ලක්ෂ හය තුල මාර්ගය නඩත්තුවට අවශ්‍ය ද්‍රව්‍ය වියදම ඇතුලත් වේ.
මීට අමතරව වාහන හා යන්ත්‍ර උපකරණ නඩත්තුව සඳහා මෙම වැය ශීර්ෂය තුලට රුපියල් එක්කෝටි හතලිස් නව ලක්ෂ හැත්තෑ දහසක් (14,970,000.00)ප්‍රතිපාදන අවශ්‍ය වෙතැයි ඇස්තමේන්තු කර ඇත.
2022 වර්ෂය සඳහා ද කොට්ඨාශ විසිපහ ඉලක්ක කර ගෙන එම කොට්ඨාශ වල සංවර්ධන කටයුතු සඳහා පහත පරිදි ප්‍රතිපාදන බෙදා වෙන් කර ඇත.

- මාර්ග, බෝක්කු, කාණු පද්ධති ඉදිකිරිම සඳහා එක් කො‍ට්ඨාශයකට රු. 1800000.00
- අඩු ආදායම් ලාභි පාසල් දරුවන් සඳහා අභ්‍යාස පොත් රු. 200000.00 ලබාදීමට එක් කො‍ට්ඨාශයකට
- වැසිකිළි ආධාර ලබා දීමට එක් කො‍ට්ඨාශයකට රු. 40000.00
- මාර්ග පදික වේදිකා පාලම්, බෝක්කු හා කාණු නඩත්තු රු. 600000.00 සඳහා එක් කොට්ඨාශයකට
- අඩු ආදායම්ලාභී සඳහා නිවාස ආධාර වශයෙන් එක් කො‍ට්ඨාශයකට රු. 100000.00

රු. 2740000.00
ඒ අනුව එක් එක් කොට්ඨාශයකට සංවර්ධන කටයුතු සඳහා රුපියල් විසිහත් ලක්ෂ හතලිස් දහස (2,740,000.00)බැගින් වෙන් කර ඇති බවත්,
මෙහි දී මාර්ග, බෝක්කු, කාණු පද්ධතිය ඉදිකිරිම වෙනුවෙන් රුපියල් හාරකෝටි පනස් ලක්ෂයක් ද (45,000,000.00)අභ්‍යාස පොත් බෙදා දීම වෙනුවෙන් ලක්ෂ පනහක් ද,(5,000,000.00)
නිවාස ආධාර වෙනුවෙන් රුපියල් ලක්ෂ විසිපහක් ද (2,500,000.00)වැසිකිළි ආධාර වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක් ද (1,000,000.00) මාර්ග, පදික වේදිකා, පාලම්, බෝක්කු, කාණු නඩත්තුව සඳහා එක්කෝටි පනස් ලක්ෂයක් ද (15,000,000.00) වශයෙන් රුපියල් හයකෝටි අසූපන් ලක්ෂයක (68,500,000.00) ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් එය සමස්ථ වියදමින් 17.3% අගයක් ගන්නා බවත් පෙන්වා දෙමි.
තවද 2022 වර්ෂයේ ක්‍රීඩා උපකරණ සඳහා ප්‍රතිපාදන වෙන් නොකරන ලද අතර ක්‍රීඩා සැණකෙලියක් පැවැත්වීමට බලාපොරොත්තු වන බැවින් ඒ සඳහා රුපියල් ලක්ෂ හතක් (700,000.00)වෙන් කෙරුණි.
ආපදා අවස්ථාවකදී හදිසි අවශ්‍යතා සඳහා රුපියල් ලක්ෂ දොලහක් ද (1,200,000.00) කුසලතා වර්ධන පුහුණු කටයුතු සඳහා රුපියල් ලක්ෂ එකොලහක්ද (1,100,000.00) වෛද්‍ය ආධාර ලබා දිමට රුපියල් ලක්ෂ දහයක්ද (1,000,000.00)සේවක සුභසාධනය සඳහා රුපියල් ලක්ෂ අටක්ද (800,000.00)වශයෙන් සුභසාධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.
ප්‍රාග්ධන වියදම් වශයෙන් පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට රුපියල් ලක්ෂ තිහක් ද (3,000,000.00)වෙන්කෙරුණි.
තුලාවල ග්‍රාමීය ක්‍රීඩාපිටිය ඉදිකිරීමට ඉඩමක් මිලදී ගැනීමට සඳහා රුපියල් කෝටියක මුදලක්ද,(10,000,000.00)
උපකරණ හා ලීබඩු මිලදී ගැනීමට රුපියල් එකොලොස් ලක්ෂ පනස්දහසක් (1,150,000.00) වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත.
සෞඛ්‍ය හා සනීපාරක්ෂක වැඩසටහන් සඳහා රුපියල් ලක්ෂ දාහතක් (1,700,000.00)වෙන්කර ඇති අතර පවතින වසංගත රෝගී තත්වයන් හමුවේ අවශ්‍ය කටයුතු සම්පාදනයට එයින් බලාපොරොත්තු වේ.
දංකොටුව නගරයේ ඉදිකර තිබෙන නගර ශාලාවේ ඉතිරි වැඩ සම්පූර්ණ කර ජනතාවගේ කටයුතු සඳහා විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සූදානම් කරමින් තිබෙන බවද සතුටින් දන්වා

සිටිමි.තවද දුම්මලදෙණිය ග්‍රාමය සඳහා බහුකාර්ය මධ්‍යාස්ථානයක් ලෙස සංවර්ධනය කිරිම අවශ්‍ය ඉඩම් කොටසක් මිලදී ගැනිම සඳහා ණය මුදලක් ලබාගැනිමට අපේක්ෂා කරමි.
අප පළාත් පාලන ආයතනය මඟින් ලබාදෙන සේවාවන් මජනතාවට සමීප කරලිමේ අරමුනින් සේවා ලාභින් සඳහා මාර්ග ගත ක්‍රමයට (ONLINE) සේවා ලබා ගැනිම සහ ගාස්තු ගෙවිමේ පහසු ක්‍රම 2021.10.29 දින සිට අප විසින් ආරම්භ කරන ලදි. ප්‍රාදේශිය සභාවක් විසින් මෙවැනි කටයුත්තක් ආරම්භ කල ප්‍රථම අවස්ථාව මෙය වන අතර එය අප ලැබූ විශාල ජයග්‍රහනයකි.
2021 වර්ෂයේදී ලැබීමට නියමිත පෙර සඳහන් කර සෞභාග්‍ය මංපෙත් හා අනෙකුත් ආධාර මුදල් වලට අදාල සංවර්ධන කටයුතු සාර්ථක කර ගැනීමට අප සැවොම එක්ව කටයුතු කල යුතුව ඇති බවත් මතක් කරමින් අවසන් වශයෙන් 2021 වර්ෂයේදී අප සභාව සතු කාර්යභාර්යය නොපිරිහෙලා ඉටුකර ගැනීම සඳහාත් බල ප්‍රදේශයේ ජනතාවට සේවය සැලසීම සඳහාත් මා සමඟින් බැදිමෙන් කටයුතු කල,
2020/2021 වසරහිදී සේවා සැපයීමේ දී මාගේ කටයුතු තුලදී මාහට සහය වු  ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ද, විශේෂයෙන් වසංගත කාලය නොතකා අප සේවාවන් ලබා දෙමින් කටයුතු කල සේවක සේවිකාවන් හා රියදුරු අංශය ද, අප ආයතනයේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මෙන්ම අප ආදහනාගාර දෙකෙහි සියළු කාර්යය මණ්ඩලය  වෙත ද, මාගේ ප්‍රණාමය පුද කරමි.
අප ආයතනය සතු ආයුර්වේද මධ්‍යස්ථාන තුලින් ලබාදෙන අඛණ්ඩ සේවාව ද, පාසල් දරුවාගේ සිට වැඩිමහල් පුරවැසියා දක්වා පත පොත සන්නිවේදනය හැකි අයුරින් ලබා දෙන්නට ද, පුස්තකාල සේවාව විවරව තබන්නට කටයුතු කලෙමි. එලෙසින්ම අපගේ අනාගත සම්පත වූ පෙර පාසල් දරුවන්ට ද, හැකි අයුරින් සේවාව ලබා දෙන්නට මා උත්සහ කල බව සඳහන් කරමි. එම සේවාවවන් ලබා දුන් සියළුම කාර්ය මණ්ඩලයට මාගේ හද්‍යාංගම ස්තුතිය පුද කරමි.
ගරු උපසභාපතිතුමාටද, ගරු කමිටු සභාපතිවරුන් ඇතුළු ආණ්ඩු පක්ෂයේ සියළු මන්ත්‍රී මණ්ඩලයටද,විපක්ෂ නායකතුමා ඇතුළු එම මන්ත්‍රී මණ්ඩලයටද,
එමෙන්ම අප වෙත නිරන්තර සහයෝගය ප්‍රධානය කරන වයඹ පළාත් පාලන කොමසාරිස්තුමන් ඇතුළු එම කාර්ය මණ්ඩලයද,
මේ වන විට පළාත් සභාව ක්‍රියාත්මක නොවූවද අවශ්‍ය අවස්ථා වලදී අනුමැතීන් ලබා දෙමින් අප වෙත නිරන්තර සහය දැක්වූ වයඹ ගරු ආණ්ඩුකාරතුමන්ටද, විශේෂ  ස්තූතිය මා පිළිගන්වමි.
තවද අප බල ප්‍රදේශයේ නියමුවානන් වන වැව්ලි කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාටත්, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය ගරු රොෂාන් රණසිංහ මැතිතුමාටත්, එම සම්බන්ධිකරන ලේකම්තුමාටත්,  ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍ය නිමල් ලංසා මැතිතුමාටත් මාගේ ගෞරවනීය ස්තූතිය පලකර සිටිමි.
නිරතුරුව ප්‍රාදේශීය සභාවේ අභිවෘද්ධිය වෙනුවෙන් සහය දක්වන වයඹ පළාත් හිටපු අමාත්‍ය සන්ද්‍යා රාජපක්ෂ මැතිතුමාටත්, හිටපු පළාත් සභා මන්ත්‍රි ට්‍රෙවින් ප්‍රනාන්දු මැතිතුමාට ද, අප සමඟ සම්බන්ධවන සියළුම මැතිතුමන්ලාවද, මා ගෞරවයෙන් සිහිපත් කරමි.
2022 වසරේ මාවිසින් අද දින සබා ගත කරනු ලබන අයවැය කෙටුම්පත සැකසීමේ දී මා හට සහය දුන් සමස්ථ කාර්යය මණ්ඩලයට ද, විශේෂයෙන් රේණුකා ප්‍රනාන්දු මිය සහ ජයනි සාගරිකා මියට ද, මාගේ ස්තුතිය පුද කරමි.
රටේ පවත්නා තත්ත්වය තුළ සියල්ල සමතුලිතය කරමින් අප ප්‍රදේශයේ සංවර්ධනයටද, ප්‍රතිපාදන ලබා දුන් ගරු මුදල් අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ මැතිතුමන්වද, මා ඉතා ඕනෑකමින් සිහිපත් කරමි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ හා ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ වැඩපිළිවල වු  සෞභාග්‍යයේ දැක්ම යතාර්ථයක් බවට පත්කරලීමට දිය හැකි උපරිම සහය ලබා දෙමින් බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන මට්ටම උසස් කරලීම සඳහා 2021 වර්ෂයේ දි මෙන්ම මා සමඟ එක්ව කටයුතු කරමින් 2022 වර්ෂයේදීද වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වයඹ අභිමානය ලෙසින් තවදුරටත් පෙර ගමන් කිරීමටද, වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවගේ බලාපොරොත්තු සඵල කිරීම සඳහා ඔබ සැමගේ සහය ලැබෙතැයි හුදෙක්ම බලාපොරොත්තු වෙමි.

ඔබ සැමට ස්තූතියි

2022 අයවැය කෙටුම්පත සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් ඉදිරිපත් කර ඇති රීති ප්‍රකාරව සංශෝධන ඉදිරිපත් කර නොමැති බව ගරු සභාපතිතුමා විසින්මහා සභාව වෙත නිවේදනය කරන ලදී.

ඉන්පසුව 2022 අයවැය කෙටුම්පත සභා සම්මත කරන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර එය ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

ප්‍රති පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් මේ අවස්ථාවේ සභාව තුළ සෝෂාකාරීව හැසිරුන අතර මෙම අයවැය සම්මත කිරීමට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මේ සඳහා විවාදයක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

මේ වන විට 2022 අයවැය කෙටුම්පත සභා සම්මත කර ඇති බැවින්ද මෙම අයවැය කෙටුම්පතට අදාලව රීති ප්‍රකාරව සංශෝධන කිසිවක් ඉදිරිපත් වී නොමැති බැවින් ද විවාදයක් පැවැත්වීම අවශ්‍ය නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දිගින් දිගටම ප්‍රතිපක්ෂ මන්ත්‍රීවරුන් සෝෂා කල බැවින් ගරු සභාපතිතුමා විසින් තේ පානයෙන් පසුව මෙ පිළිබඳව අදහස් දක්වන ලෙස මහා සභාව වෙත දන්වන ලදී.

තේ පානයෙන් පසු නැවත පැමිණි ගරු මන්ත්‍රීවරුන් ඇමතු ගරු සභාපතිතුමා විසින් 2022 අයවැය කෙටුම්පතට ඡන්දය විමසන ලෙස ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

ඒ අනුව ලේකම් මහතා විසින් සභා සර්භයේ සිටි සියළුම මන්ත්‍රීවරුන්ගෙන් වාචිකව විමසා ඡන්දය සටහන් කර ගන්නා ලදී.

ඒ අනුව එම අවස්ථාවේ සභා සර්භයේ සිටි ගරු මන්ත්‍රීවරුන් 23 දෙනෙකු මෙම 2022 වර්ෂයට අදාල අයවැය කෙටුම් පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කල අතර පැමිණීමේ ලේඛණයේ අත්සන් කර ඡන්දය විමසන අවස්ථාවේ සභා සර්භයේ නොසිටි ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 11 දෙනෙකි. මෙදින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 10කි.

ඒ අනුව 2022 අයවැය කෙටුම්පත සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 12.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.